## රෙජිමේන්තු

# මංගලහස්ති පරපුරේ

# නවවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය



ශ්‍රී ලංකා පාබල හමුදාවේ “කණ්ඩුල” යනු වීර දුටුගැමුණු රජතුමාගේ රාජකීය කණ්ඩුල හස්තියාගේ ජීවමාන ප්‍රතිරූපයයි, එය ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ අඛණ්ඩව පැවත එන මංගල වස්තුවයි...

මිහිතලය මත සිය දෙපයින්
නැගී සිටින්නට
මිනිස් වර්ගයා දැරූ වෑයමේ දී
සොබාදහම විසින් මිනිසාට
දායාද කරන ලද
අතිජාත මිතුරකු, ආරක්ෂකයෙකු
මතු නොව
සංස්කෘතික දූතයෙකු ලෙස
උදාර මෙහෙවරක් ඉටුකළ
කණ්ඩුලවරුන් ප්‍රමුඛ
සමස්ත හස්ති පරපුරට
ප්‍රණාමය පිණිසයි...



# "නිල්ගල" හෙවත් නවවන කණ්ඩුල


# නවවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය



වසර 141 ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව (ශ්‍රීලපාහ) 1960 වර්ෂයේ සිට 2021 අප්‍රේල් මස 28 වන දින තෙක් ''මංගල වස්තුව'' ලෙසින් හස්ති රාජයෙකු විවිධ සම්මාන උත්සව සහ දෙස් විදෙස් රාජ්‍ය නායකයින් වෙනුවෙන් පිරිනමන සම්මාන මුර හා පෙළපාළි සිදු කිරීම සඳහා යොදවාගත් අතර, ඒ තුළින් ශ්‍රී ලාංකීය අභිමානය ඉතාමත් ඉහළින් නිරූපණය වන ලදී. පවතින නෛතික රාමුව තුළ නවවන කණ්ඩුල ලෙස නව අලි පැටවෙකු ලබාගැනීම වෙනුවෙන් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ජ්‍යෝෂ්ඨ නිලධාරීගේ නායකත්වය හා අධීක්ෂණය යටතේ පිඹුරුපත් සකස් කෙරිණි. මෙම ක්‍රියාදාමයේ දී අදාළ අලි පැටවා ලබාගැනීම වෙනුවෙන් මනා ප්‍රවේශයක් ලබාදීමට එවකට මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස කටයුතු කළ බ්‍රිගේඩියර් ටීසීකේ පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෝෂ්ඨ නිලධාරී සහ වත්මන් රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් එම්පීඑස්පී කුලසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෝෂ්ඨ නිලධාරීගේ මගපෙන්වීම මත මධ්‍යස්ථාන නියෝජ්‍ය සේනාවිධායක කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ජ්‍යෝෂ්ඨ නිලධාරී නවවන කණ්ඩුල ලෙස රාජකාරි කිරීමට සුදුසු අලි පැටවෙකු සෙවීමේ භාරදූර කාර්යයට මුලපුරන ලදී. දෙහිවල සත්ත්ව උද්‍යානය, උඩවලව ඇත්



අතුරු සෙවණ, රිදීගම සෆාරි උද්‍යානය හා පින්නවල අලි සුරක්ෂිතාගාරය යන ස්ථානයන්හි සිදුකරන ලද නිරීක්ෂණ චාරිකාවන් හි ප්‍රතිඵලයක් වශයෙන් වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යංශය, නීතිපති දෙපාර්තමේන්තුව හා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ඇතුළු අනුබද්ධිත රාජ්‍ය ආයතන විසින් දැනට පින්නවල අලි සුරක්ෂිතාගාරයේ වාසය කරන ''නිල්ගල'' නමැති අලි පැටවා නීත්‍යානුකූලව මෙම රෙජිමේන්තුව වෙත පවරා ගැනීමේ මෙහෙයුම ආරම්භ විය.



නිල්ගල අලි පැටවාගේ රාජකාරීන් සිදුකිරීම වෙනුවෙන් පළපුරුදු ඇත්ගොව්වන් දෙදෙනකුගේ බඳවාගැනීම් කටයුතු කඩිනමින් සිදුකළ රෙජිමේන්තු මධ්‍යස්ථානය, අලි පැටවාගේ මූලික පුහුණුවීම් සහ අලිපැටවා ඔවුන් වෙත හුරු කරගැනීම පිණිස අලිපැටවා නවාතැන් ගෙන සිටි පින්නවල අලි සුරක්ෂිතාගාරය වෙත අනුයුක්ත කිරීමට අවැසි මූලික කටයුතු සිදුකෙරිණි.



ශ්‍රී ලංකා පාබල හමුදා ඉතිහාසයේ මංගල වස්තුවක් ලෙස කණ්ඩුල නම් අලි පැටවා හඳුන්වාදුන් දින සිට වසර එකහමාරක් වැනි දීර්ඝ කාලයක් මුළුල්ලේ මංගල වස්තුවක් ලෙස නව අලි පැටවෙකු ලබාගැනීම වෙනුවෙන් සිදුකළ සියලු ක්‍රියාකාරකම් මල්ඵල ගන්වමින් මෙම අලි පැටවා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත ලබාගැනීම වෙනුවෙන්

වූ ගිවිසුම අත්සන් තැබීම 2022 නොවැම්බර් මස 23 වන දින දෙහිවල ජාතික සත්ත්ව උද්‍යානයේ දී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සුරතින් සිදුවිය. ඉන් අනතුරුව පින්නවල අලි සුරක්ෂිතාගාරයේ ''නිල්ගල'' ලෙස තම අණසක පතුරවමින් සිටි එම අලි පැටවා රෙජිමේන්තු මධ්‍යස්ථානය කරා ප්‍රවාහනය කිරීමේ කටයුතු ද එදින සන්ධ්‍යාභාගයේ දී ආරම්භ කෙරිණි.



2022 නොවැම්බර් මස 24 වන දින නවවන කණ්ඩුල ලෙස ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය වෙත මඟුල්බෙර හඬ මධ්‍යයේ සම්ප්‍රාප්ත වූ ''නිල්ගල'' අලි පැටවා රෙජිමේන්තු විහාරස්ථානය වැඳපුදා ගැනීමෙන් අනතුරුව ත්‍රිවිධරත්නයේ ආශිර්වාදය ලැබ සුබ මොහොතින් සිය රාජකාරී ආරම්භ කරන ලදී.




# කණ්ඩුල පරපුරේ විකාශනය




ඉපැරණි රජ දවස රාජ්‍ය සංස්ථාව තුළ තිබූ සන්නද්ධ අංශයන්හි කිසියම් මංගල වස්තුවක් ලෙස සතෙකු සිටි බැව් වංශ කථා මූලාශ්‍ර වලින් පැහැදිලි වේ. 1 වන ලංකා පාබල හමුදාව ආරම්භයේ සිටම මෙම පැරණි ගතානුගතික සම්ප්‍රදායික පිළිවෙත ආරක්ෂා කරමින් මෙම බළඇණියට මංගල වස්තුවක් සෙවීමේ කාර්යයෙහි නිරතවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1954 වර්ෂයේ එම බළඇණියට අණදුන් කර්නල් ඒඑම් මුතුකුමරු ඩබ්ලිව්ආර්ඩීඒඩීසී අයිඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් තම බළඇණි බලප්‍රදේශයට අයත් තනමල්විල ප්‍රදේශයේ කැලෑවක "ටයිරෝ" නම් වන අභ්‍යාසයේ යෙදෙමින් සිටින අතරතුර දී අලංකාර අං ඇති මුවෙකු අල්ලා ගැනීමට හැකි විය. එම මුවා පාබල හමුදාවේ ප්‍රථම මංගල වස්තුව ලෙස නම් කරන ලද අතර, මෙලෙස මංගල වස්තුව ලෙස රැගෙන ආ මුවාගෙන් අණදෙන නිලධාරී අපේක්ෂා කරන ලද්දේ සම්මාන පෙළපාළි සඳහා මෙම සතා සහභාගි කරවා කිසියම් චමත්කාරයක් සහ වර්ණවත් බවක් පෙළපාළිය වෙත ලබාදීමයි.

මේ සඳහා මෙම සත්වයා ශ්‍රී ලංකා පාබල හමුදාවේ සම්ප්‍රදායානුකූලව පැවත එන සරඹ විලාසයන්ට සහ ආචාර කිරීම්වලට පුහුණු කරවිය යුතු විය. තූර්යවාදක කණ්ඩය සතු බෙරවල හඬට මුවාගේ පාද තැබීමටත්, ආචාර කරවීමටත් පුහුණු කිරීම සඳහා මහත් වෙහෙසක් දැරීමට සිදුවිය. එසේ පුහුණු කිරීමක් සිදු වූ එක් අවස්ථාවක කූඩුව සමීපයේ බෙරකරු විසින් නොනවත්වා බෙර වාදනයේ යෙදෙමින් සිටිය දී එයින් බියට පත් වූ මුවා කූඩුව තුළම මරණයට පත් විය.



# පළමුවන කණ්ඩුල



පාබල හමුදාවේ ප්‍රථම මංගල වස්තුව නොසිතූ අයුරින් මෙලෙස අහිමි වුව ද, ශ්‍රී ලංකා පාබල හමුදාව තවදුරටත් සිය බළඇණියට මංගල වස්තුවක් සෙවීමේ කාර්යයේ නිරත වීය. මේ සඳහා පාබල හමුදාව විසින් රජයට, යුද හමුදා මූලස්ථානයට, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන කීපයකට ද සිය බළඇණිය වෙනුවෙන් මංගල වස්තුවක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර තිබුණි. මෙම පූර්ව දැනුම්දීමේ ප්‍රතිඵලයක් ලෙස 1960 සැප්තැම්බර් මස එවකට සත්ත්ව උද්‍යානයේ අධ්‍යක්ෂව සිටි මේජර් ඕබ්රි වයිමන් ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් කුඩා අලි පැටවෙකු මංගල වස්තුව ලෙස 1 ලපාහට ලබාදීමට එකඟතාවය පළකරන ලදී. මෙම අලි පැටවා අල්ලාගැනීම පිළිබඳව 1960 සැප්තැම්බර් මස 10 දින ''සිලෝන් ඩේලි නිව්ස්'' පුවත්පතෙහි පහත සඳහන් විශේෂ වාර්තාව පළකර තිබුණි.


''දැදුරුඔය අසබඩ ගැවසෙන අලි රංචුවක් ඇල්ලීමට පළපුරුදු අලි අල්ලන්නන් කණ්ඩායමක් ගෙන්වාගනු ලැබූවේ මන්නාරමෙනි. ඔවුන්ගේ අලි ගාල් කිරීමේ දෙවන පියවර සඳහා සති දෙකක් ගතවිය. එම සතිය තුළ දරන ලද දැඩි පරිශ්‍රමයකින් ඉක්බිතිව හලාවත නගරයට සැතපුම් අටක් දුරින් පිහිටි රඹෑපිටිය ගම්මානයේ දී සුරතල් අලි පැටවෙකු අල්ලා ගැනීමට හැකි විය. අඩි 5ක් පමණ උසැති පිරිමි සතෙකු වන මොහුගේ වයස අවුරුදු 5ක් පමණ වෙතැයි පැවසේ. ''

මෙම කුඩා අලි පැටවා පිළිබඳව විවිධ ජනමාධ්‍ය මගින් මහත් ප්‍රචාරයක් ලබාදුන් අතර, 1960 සැප්තැම්බර් මස 11 වන ඉරුදින ''ඔබ්සවර්'' පුවත්පත ද, ''ඩේලි නිව්ස් '' පුවතට තවත් කරුණු එකතු කරමින් එම අලි පැටවා ලංකා පාබල හමුදාවේ මංගල හස්තියා වීමට ඉඩ ඇති බවට ඉඟියක් ද පළකර තිබුනේ මෙසේ ය.

06

රෙජිමේන්තු

# මංගලහස්ති පරපුරේ නවවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය



''දින දෙකකට ඉහත පැය අටක දැඩි පරිශ්‍රමයකින් පසුව අල්ලාගනු ලැබූ අලි පැටවා ලංකා පාබල හමුදාවේ මංගල වස්තුව බවට පත්වීමට බෙහෝ දුරට ඉඩ ඇති බව වාර්තා වේ. එම කාර්යය සඳහා මෙම අලි පැටවා ඉතා අගනේ යැයි සත්ත්ව උද්‍යානයේ අධ්‍යක්ෂ ඕබ්රි වයිමන් මහතා පවසයි.'' 1961 ජනවාරි මස 02 වන දින නිල වශයෙන් මෙම අලි පැටවා 1 ලපාහ බළඇණිය වෙත පරිත්‍යාග කෙරුණි. මේ පිළිබඳව විවිධ ජනමාධ්‍ය විසින් පලකර තිබූ වාර්තාවන් කිහිපයක් මෙසේ සඳහන් කරන්නෙමු.


''දෙහිවල සත්ත්ව උද්‍යානයේ අධ්‍යක්ෂක මේජර් ඕබ්රි වයිමන් විසින් ලංකා පාබල හමුදාවේ 1 වන බළඇණියේ මංගල වස්තුව බවට පත්කර ගැනීම සඳහා හුරුබුහුටි අලි පැටවෙකු අද උදෑසන කර්නල් රිචඩ් උඩුගම වෙත භාරදෙනු ලැබී ය.''

''අලි පැටවෙකු සිය මංගල වස්තුව බවට පත්කර ගැනීමෙන් ශ්‍රී ලංකා යුද හමුදාව අද ඉතිහාසයට එක්වූයේ ය. පනාගොඩ රෙජිමේන්තු මූලස්ථානයේ මෙම අලි පැටවා තබාගන්නා බව කර්නල් උඩුගම පැවසුවේ ය. ලංකාවේ පහළ වූ අද්විතීය රජෙකු වූ දුටුගැමුණු රජතුමා යුද්ධයට නැගී ගිය එඩිතර වීරෝදාර ඇතාගේ නම වූ ''කණ්ඩුල'' නමින් මෙම අලි පැටවා හැඳින්වීමට ඔවුන් තීරණය කර ඇත.''

1961 ජනවාරි මස 02 වන දින පළමුවන කණ්ඩුල නමින් පාබල හමුදාවට එක්වූ මෙම අලි පැටවා එදින සිට ලංකා පාබල හමුදාවේ මංගල වස්තුව විය. පාබල හමුදාවේ සම්ප්‍රදායානුකූලව පැවත එන සරඹ විලාසයන්ට සහ ආචාර කිරීම් වලට පුහුණු කරවීම සඳහා තවදුරටත් එම අලි පැටවා සත්ත්ව උද්‍යානයේම තබන ලදී. ශ්‍රී ලංකා පාබල හමුදාව අපේක්ෂා කළ පුහුණුවෙන් අනතුරුව මෙම අලි පැටවා හෙවත් ''පළමුවන කණ්ඩුල'' 1961 ජූලි මස 08 වන දින පනාගොඩ කඳවුර වෙත නැවත රැගෙන එන ලදී. පුංචි කණ්ඩුල රැකබලාගැනීමේ භාරදූර වගකීම පැවරුණේ 1 ලපාහ බළඇණියට අයත් කෝප්‍රල් කරුණාදාස හා පාබල සෙබළ ගුණතිලක හට ය. එහෙත්, කණ්ඩුල තවදුරටත් පුහුණුකිරීම සඳහා පළපුරුදු ඇත්ගොව්වෙකුගේ අවශ්‍යතාවය තදින්ම මතුව තිබුණි. ඒ අනුව එවකට සත්ත්ව උද්‍යානයේ සේවය කළ ටීඒ සිරිසේන නම් තරුණයා හමුදා සෙබළෙකු වශයෙන් බඳවාගනිමින් එම අවශ්‍යතාවය ද සපුරාගැනීමට ලංකා පාබල හමුදාව කටයුතු කළේ ය.

කාලයාගේ ඇවෑමෙන් ක්‍රමවත් පුහුණුවක් ලැබූ කණ්ඩුල එකල පැවති නිදහස් සම්මාන පෙළපාළිවල දී එක් අණකට ක්ෂණිකව ආචාරය පුදකිරීම, පෙළපාළිය නරඹන විදේශීය රාජ්‍ය නායකයන්ගේ ද විශ්මයට මෙන්ම අමන්දානන්දයට හේතු විය. ඒ අතර, පළමුවන කණ්ඩුල සිය අභිමානය විදහා පෑ විශේෂ අවස්ථාවන් අතර, 1963 වර්ෂයේ අනුරාධපුරයේදී ද, 1964 වර්ෂයේ දී ගාලු මුවදොරදී ද, 1965 වර්ෂයේ බදුල්ලේදී ද ජාතික නිදහස් දින උත්සව වෙනුවෙන් සහභාගී වීම, 1966 පෙබරවාරි 10 වන දින බුරුම රාජ්‍ය නායක නෙවින් සෙනෙවිතුමාට පිරිනැමූ සම්මාන මුරය, 1966 ජූලි 08 වන දින ගරු අග්‍රාණ්ඩුකාරතුමා වෙනුවෙන් පැවති සම්මාන මුරය හා 1966 සැප්තැම්බර් මස 12 වන දින පනාගොඩ යුද හමුදා ජනපදයේ දී ගරු අග්‍රාමාත්‍යතුමිය වෙත පිරිනමන ලද සම්මාන මුරය ආදිය සුවිශේෂී ස්ථානයක් ගනී. පළමුවන කණ්ඩුල ලංකා පාබල හමුදාවට ලබාදුන් සය වසරක විශිෂ්ට සේවාවට කෘතගුණ සැළකීමක් වශයෙන් 1967 ජූලි මස 26 දින රෙජිමේන්තු සරඹ භූමියේ දී ආචාර පෙළපාළියක් පවත්වා සුබපැතීමෙන් අනතුරුව දෙහිවල සත්ත්ව උද්‍යානය වෙත භාරදෙන ලදී.

# දෙවන කණ්ඩුල



පළමුවන කණ්ඩුලගේ සමුගැනීමෙන් හිස් වූ කණ්ඩුල තනතුර වෙනුවෙන් මංගල වස්තුවක් ලබාදීමට සත්ව උද්‍යාන පාලක මණ්ඩලය එකඟ විය. ඒ අනුව 1967 අගෝස්තු මස 01 වන දින දෙවන කණ්ඩුල නමින් වයස අවු 03ක් වූ කුඩා අලි පැටවෙකු පාබල හමුදාවට එක් විය. පළමුවන කණ්ඩුලගේ පුරප්පාඩුව ඒ අයුරින්ම පූර්ණය කිරීමට සමත් වූ මෙම අලි පැටවා තමන්ට පැවරුණු රාජකාරිවලට හුරුවීමට වැඩි කාලයක් නොගත් අතර, බළඇණි හටපිරිස් හා එක්ව විවිධ ආචාර පෙළපාළිවලට සහභාගී වීමට දෙවන කණ්ඩුලට ද අවස්ථාව ලැබිණි.

ඒ අතර, 1967 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දින විශ්‍රාම දිවියට පිවිසි යුද්ධ හමුදාධිපති මේජර් ජෙනරාල් බීආර් හයින් වෙත පනාගොඩ යුද හමුදා ජනපදයේ දී පිරිනමන ලද සම්මාන මුරය, 1968 දී කොළඹ දීත්, 1969 දී මහනුවරදීත් පවත්වනු ලැබූ නිදහස් දින පෙළපාළි වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

# තෙවන කණ්ඩුල



දෙවන කණ්ඩුල බළඇණියේ සිටියදීම පින්නවල අලි සුරක්ෂිතාරයේ රාජා **II** නමින් සිටි කුඩා අලි පැටවෙකු බළඇණිය වෙත ගෙනැවිත් තෙවන කණ්ඩුල නමින් නම් කිරීමට එවකට අණදෙන නිලධාරීව සිටි ලුතිනන් කර්නල් සීඑච්එම්එන් සිල්වා ශ්‍රීලපාහ ක්‍රියාකරන ලද්දේ දෙවන කණ්ඩුල විශ්‍රාම ගැනීමට පෙරාතුව තෙවැනියෙකු පුහුණු කරගැනීමේ මූලික පරමාර්ථයෙනි.

1976 මාර්තු මස 02 වන දින පනාගොඩට රාජා **II** නමින් පැමිණි තෙවන කණ්ඩුලට වැඩිකාලයක් බළඇණියේ රැඳෙන්නට දෛවය ඉඩ දුන්නේ නැත. බාහිර ලක්ෂණ අතින් මංගල හස්තියෙකුගේ ලකුණු ප්‍රකට කළ ද, මෙම කුඩා අලි පැටවා හට හදිසියේම ඇති වූ යටිපතුල් වණවීම නම් රෝගය නිසා රෝගාතුර විය. එම රෝගයට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් දිවයිනේ ප්‍රකට අලි වෙද මහතුන්ගේ දැනුම යොදාගත්ත ද, තෙවන කණ්ඩුල ලෙස කිරුළ දැරීමට පෙරාතුව 1976 අප්‍රේල් මස 12 වන දින සදහටම දෑස් පියාගන්නා ලදී. පසුව පින්නවල අලි අනාථාගාරයේම සිටි ''ගැමුණු'' නම් අලි පැටවෙකු 1978 ජනවාරි මස 25 වන දින බළඇණියට රැගෙන එන ලදී. එම අලි පැටවා ද රෝගාතුර වීම හේතුවෙන් කණ්ඩුල ලෙසින් නම් කිරීමට මත්තෙන්ම හදිසියේ මිය යන ලදී. දෙවන කණ්ඩුල 1967 වර්ෂයේ සිට 1984 මාර්තු මස 01 වන දින තෙක්ම සේවය කළ අතර, සේවය ඇගයීමක් වශයෙන් එවකට අණදෙන නිලධාරීව කටයුතු කළ ලුතිනන් කර්නල් යූඑජ් කරුණාරත්න පීඑස්සී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් සරඹ භූමියේ පෙළපාළියක් පිරිනමා සමුදීමෙන් පසු දෙවන කණ්ඩුල දෙහිවල සත්ත්ව උද්‍යානය වෙත භාර දෙන ලදී.

# සිව්වන කණ්ඩුල



සිව්වන කණ්ඩුල නමින් බළඇණියට එක් වූ කුඩා අලි පැටවා ගලහ ප්‍රදේශයේ මැණික් පතලක වැටී සිටිය දී ගම්වාසීන් විසින් වන සත්ත්ව නිලධාරීන්ට දැන්වීමෙන් පසු ඔවුන් එම අලි පැටවා අල්ලා පින්නවල අලි අනාථාගාරය වෙත භාරදී ඇත. එහි දී '' වීරා'' නමින් හැඳින්වුනු වයස අවුරුදු 3 ක් වූ මෙම කුඩා අලි පැටවා 1984 මාර්තු මස 01 වන දින සම්මාන පෙළපාළියක් පවත්වා සිව්වන කණ්ඩුල ලෙසින් අභිශේක ලැබී ය. 1993 අගෝස්තු මස 11 වන දින තෙක් පාබල හමුදාවේ සේවය කළ සිව්වන කණ්ඩුල සමුගැනීමේ පෙළපාළියකින් අනතුරුව පින්නවල අලි සුරක්ෂිතාගාරය වෙත භාර දෙන ලදී.

# පස්වන කණ්ඩුල



පින්නවල අලි සුරක්ෂිතාගාරයෙන් ලැබූ පරිත්‍යාගයක් ලෙසින් එක් වූ පස්වැනි කණ්ඩුල එහි දී හැඳින්වූයේ ''බිබිලා'' නමිනි. මෙම කුඩා අලි පැටවා ද කණ්ඩුල පරම්පරාවෙන් ලද දායාදයක් ලෙසින් ඉතා කෙටි කාලයක් ඇතුළත තූර්යවාදන හඬට හුරු විය. මංගල හස්තියෙකු හට කලාතුරකින් උදාවන විරල ගණයේ රාජකාරීන් කිහිපයක් ඉටුකිරීමේ භාග්‍යය ද පස්වැනි කණ්ඩුලට හිමි විය.

1995 ජනවාරි මස 02 වන දින ශ්‍රී ලංකාවට සැපත් වූ දෙවන ජුවාන් පාවුළු ශුද්ධෝත්තම පාප් වහන්සේ වෙත පිරිනමන ලද සම්මාන මුරයට සහභාගී වීම, 1998 වසරේ ශ්‍රී ලංකාවේ 50 වැනි නිදහස් ස්වර්ණජයන්තිය වෙනුවෙන් සපැමිණි බ්‍රිතාන්‍යයේ කිරුළ හිමි චාල්ස් කුමරුන් වෙත පිරිනැමූ උත්තමාචාර පෙළපාළියට සහභාගී වීම හා තුන්කොන් ක්‍රිකට් තරඟාවලියක් වෙනුවෙන් ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දිය හා පකිස්තානු ක්‍රිකට් කණ්ඩායම් පිළිගැනීම සඳහා 1996 පෙබරවාරි මස 13 වන දින පවත්වන ලද ආචාර පෙළපාළියේ පෙරගමන්කරුවා වශයෙන් කටයුතු කිරීම වැනි සුවිශේෂී අවස්ථාවන් සඳහා පස්වැනි කණ්ඩුල ලබාදුන් දායකත්වය අනභිබවනීය වේ. මෙලෙස ශ්‍රී ලංකා පාබල හමුදාවේ කීර්තිය එතෙර මෙතෙර පතුරවමින් දස වසරකට ආසන්න කාලයක් මංගල වස්තුව ලෙසින් බැබළුණු පස්වැනි කණ්ඩුල 2002 නොවැම්බර් මස 18 වන දින සිය මෙහෙවර නිමාකරමින් පින්නවල සුරක්ෂිතාගාරය බලා පිටත්ව යන ලදී.

# සයවන කණ්ඩුල



1997 පෙබරවාරි මස 07 වන දින පින්නවල අලි සුරක්ෂිතාගාරයේ උපත ලද කුළුඳුල් අලි පැටවා ලෙස වාර්තා අතරට එක්වෙමින් ''අර්ජුන'' නමින් සයවන කණ්ඩුල 2001 දෙසැම්බර් මස 12 වන දින පාබල හමුදා සෙවනේ රාජකාරී අරඹන ලදී. පළපුරුදු හමුදා ඇත්ගොව්වන්ගේ අධීක්ෂණය යටතේ සයවන කණ්ඩුල සිය වගකීම් මැනවින් ඉටුකරන ලද අතර, ශ්‍රී ලංකා ගුවන් හමුදාධිපතිතුමා විශ්‍රාම යෑම වෙනුවෙන් 2002 ජූලි මස 15 වන දින පිරිනමන ලද සම්මාන මුරය, 2003, 2004 සහ 2005 යන වසරවල ජාතික නිදහස් දින උත්සව පෙළපාළි සඳහා සහභාගීවීම, 2006 අගෝස්තු මස 08 වන දින පැවති දකුණු ආසියාතික ක්‍රීඩා උළෙලේ ගිණිසිළුව රැගෙන යාම ආදී අවස්ථා රැසකට සහභාගීවීමේ භාග්‍යය මෙම හස්තියාට හිමි විය. මව්බිමේ නිදහස වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව දිවි පරදුවට තබා සටන්වදිමින් සිටි සමයක තම අද්විතීය සේවය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ලබාදෙමින් 2009 මැයි මස 20 දින සිය තනතුරෙන් විශ්‍රාම ගනු ලැබූයේ බියෙන් සැකෙන් තොර නිදහස් නිවහල් දේශයක ජීවත්වීමට සමස්ත ලක් වැසියන්ට අවස්ථාව උදාකර දුන් රණවිරුවන්ගේ ආචාර සමාචාර මධ්‍යයේ වීම තවත් එක් සුවිශේෂී කරුණකි.

# සත්වන කණ්ඩුල



නිදහස්, නිවහල් දේශයක සත්වන කණ්ඩුල ලෙසින් 2009 මැයි මස 05 වන දින ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත පැමිණි ''ගැමුණු'' නම් අලි පැටවා පින්නවල සුරක්ෂිතාගාරයේ වාසය කළ තවත් භාග්‍යවන්ත අලි පැටවෙකි. පනාගොඩ කඳවුර වෙත රැගෙන ආ සත්වන කණ්ඩුල නූතන කණ්ඩුල පරපුරේ ස්වරණ ජයන්තිය සමරනු ලබන මොහොතේ එහි මංගල හස්තියා ලෙස කණ්ඩුල පරපුර නියෝජනය කිරීමේ වාසනාවට ද හිමිකම් කියන්නේ ය. ඉන්දීය හමුදාපතිවරයෙකු හට ආචාරය පුදකිරීමේ අවස්ථාව උදාකරගත් ප්‍රථම මංගල හස්තියා වූයේ ද සත්වන කණ්ඩුලයි. තවද, 2011 වසරේ කතරගම කඳසුරිඳුගම ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවති ජාතික නිදහස් දින සමරු උළෙලට සහභාගීවීමේ වරම ලද සත්වන කණ්ඩුල 2014 දෙසැම්බර් මස 31 වන දින සිය ගෞරවනීය සේවයට විශ්‍රාම දෙමින් ශ්‍රී ලංකා පාබල හමුදාවට සමුදෙන ලදී.

# අටවන කණ්ඩුල



අටවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය 2014 ජනවාරි මස 29 වන දින සිදු විය. මීට වසර තුනහමාරකට පෙර උඩවලව වනෝද්‍යානයේ උපත ලද මෙම අලි පැටවා මවගේ රැකවරණයෙන් මිදීමෙන් පසු කැළයේ අතරමංව සිටිය දී වනජීවි නිලධාරීන්ට හමුවී ඇත. ඉන් පසු මෙම අලි පැටවා උඩවලව ඇත් අතුරු සෙවණෙහි ඇතිදැඩිවී ඇත්තේ ''රැකටි'' යන නමිනි. එවකට ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සුරතින් එවකට යුද්ධ හමුදාධිපතිව සිටි ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් භාරගෙන ඇත.

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ අටවන කණ්ඩුල ලෙසින් අභිමානයෙන් වැජඹෙමින් රාජකාරී කරන ලද මෙම අලි පැටවා 2015 වර්ෂයේ සිට නොකඩවා 2021 වර්ෂය දක්වා පැවති ජාතික නිදහස් දින පෙළපාළි සඳහා ද, රෙජිමේන්තුව තුළ පිරිනමන ලද සම්මාන මුර සහ පෙළපාළි රාශියකට ද තම දායකත්වය ලබා දී ඇත. ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ලබාදුන් තම ගෞරවනීය සේවය නිමාකොට 2021 අප්‍රේල් මස 28 වන දින විශ්‍රාම යන ලදී.

රෙජිමේන්තුවක් ලෙස සියලු නිලයින්ගේ කැපවීම හා නොපසුබට උත්සාහය මත නැවත රෙජිමේන්තුව සතුකරගත් ශ්‍රී ලංකා පාබල හමුදා මංගල වස්තුව "කණ්ඩුල" හට රෙජිමේන්තු ගෞරවය හා අනන්‍යතාවය රැකගනිමින් රාජකාරී කිරීමට අවැසි ශක්තිය හා ධෛර්යය නොඅඩුව ලැබේවායි අප ප්‍රාර්ථනා කරන්නෙමු

## රෙජිමේන්තු මංගලහස්ති පරපුරේ

# නවවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය

